# 1 ව්‍යාපාර පදනම හා පරිසරය

## ව්‍යාපාර සංකල්පය හැඳින්වීම

ව්‍යාපාර යන සංකල්පයට පොදුවේ පිළිගත් අර්ථකථනයක් මෙතෙක් ප්‍රකාශයට පත් වී නොමැත එය විවාදයට භාජනය වෙමින් පවතී.

බොහෝ දෙනකු ව්‍යාපාරය යන්න හඳුන්වන්නේ ලාභ ලැබීමේ අරමුණින් පවත්වාගෙන යන ආර්ථික කටයුත්තක් ලෙසයි.

ව්‍යාපාර පසුපස ඇති මෙහෙයුම් බලවේගය ලාභය හෙවත් ලාභ අපේක්ෂාව වුවද සෑම ව්‍යාපාරයකටම අපේක්ෂාව ලාභ ඉපයීම නොවේ. පාසල් ආරෝග්‍යශාලා, පුණ්‍ය ආයතන මෙන්ම රතු කුරුස සමාජය, සිංහ සමාජය වැනි සමාජ සේවා ආයතන මීට නිදසුන් ලෙස දැකිය හැක.

තවත් සමහරෙක් ව්‍යාපාර යන්න හඳුන්වන්නේ මිලට ගැනීම්ට හා විකිණීමටට අදාළ කාර්යයක් ලෙසයි නමුත් ව්‍යාපාර යනු භාන්ඩයක් මිලදීගෙන විකිණීමට වඩා පුළුල් පරාසයක් දක්වා විහිදෙන ක්‍රියාවලියකි

## ව්‍යාපාර අර්ථ දැක්වීම්

මිනිස් අවශ්‍යතාහා වුවමනා ඉටු ඉටුකරලීම සඳහා ඇති ඕනෑම ආර්ථික කටයුත්තකි

නැතහොත්

ලාභ ලැබීමේ අරමුණින් හෝ ලාභ අරමුණින් තොරව පවත්වාගෙන යන මිනිස් අවශ්‍යතාහා වුවමනා සපුරාලීම සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා නිෂ්පාදනය බෙදා හැරීම අලෙවිය හා අනුබද්ධ සියලු කටයුතු වූ ව්‍යාපාර වේ

## අවශ්‍යතා හා වූ වුවමනා

### අවශ්‍යතා

මිනිසාගේ පැවැත්ම තහවුරු කර ගැනීමට අත්‍යවශ්‍යයෙන්ම සපුරාගත යුතු තත්ත්වයන් ය.

එනම්,

මිනිසා විසින් අනිවාර්යයෙන්ම සපුරා ගත යුතු කායික හා මානසික තත්ත්ව මිනිස් අවශ්‍යතා ලෙස හැඳින්වේ.

උදාහරණ :- ආහාර

ඇඳුම්

නිවාස

අධ්‍යාපනය

සෞඛ්‍යය

සන්නිවේදනය

## අවශ්‍යතා වල ලක්ෂණ

01) ජීවත්වීම සඳහා අත්‍යවශ්‍යයෙන්ම සපුරාගත යුතු වීමයි.

02) පොදු වීම් - සෑම පුද්ගලයකුගේම අවශ්‍යතා එක හා සමාන වීමයි.

03) සීමිත වීම - අවශ්‍යතා සංඛ්‍යාත්මකව ඉතා කුඩා ප්‍රමාණයක් පවතී.

04) ව්‍යාපාරිකයින්ට නිර්මාණය කළ නොහැකි වීම - අවශ්‍යතා නිසගයෙන් බිහි වන අතර ව්‍යාපාරයකුට සකස් කර නොහැක.

05) සමාජ බලවේග මගින් වෙනස් කළ හැකි වීම - සමාජයේ බලවේග මත අවශ්‍යතා වෙනස් කළ නොහැකි වීම.

**වුවමනා**

මිනිස් අවශ්‍යතා සපුරා ගන්නා විවිධ ආකාර වුවමනා ලෙස හැඳින්වේ.

## වුවමනා වල ලක්ෂණ

01) අසීමිත වීම - උවමනා සංඛ්‍යාත්මකව ප්‍රමාණය ගණනය කළ නොහැකි වීම.

02) විවිධ වීම - අවශ්‍යතා සපුරා ගන්නා ආකාර පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වීම.

03) ව්‍යාපාරිකයින් නිර්මාණය කළ හැකි වීම - උවමනා ව්‍යාපාරිකයන්ට බිහි කළ හැකි වීමයි.

04) අවශ්‍ය නොවීම - ජීවත්වීම සඳහා යම් උවමනාවක් සපුරා ගැනීම අනිවාර්ය නොවන අතර ඒ හා සමාන වෙනත් වුවමනාවකින් ද අවශ්‍යතා සපුරාගත් හැක.

අවශ්‍යතා හා වුවමනා නිදසුන් සහිතව ඉදිරිපත් කිරීම්

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

...........................................................................................

## අවශ්‍යතා හා වුවමනා අතර වෙනස්කම්

| අවශ්‍යතා | වුවමනා |
|---|---|
| • සීමිත වීම. | • අසීමිත වීම. |
| • පොදු වීම්. | • විවිධ වීම. |
| • ජීවත්වීම සඳහා අත්‍යවශයයෙන්ම සපුරාගත යුතු වීමයි. | • ජීවත්වීම සඳහා අත්‍යවශයයෙන්ම සපුරාගත යුතු නොවීම. |
| • සමාජ බලවේග මගින් වෙනස් කළ නොහැක. | • සමාජ බලවේග මගින් වෙනස් කළ හැක. |

## පුද්ගලයෙකුට තම අවශ්‍යතා ඉටුකර ගත හැකිය ආකාර.

1. තමා විසින්ම උපදවා ගැනීම

- පරිභෝජනයට අවශ්‍ය  දෑ තමා විසින්ම නිපදවා ගැනීමයි.

2. සොයා ගැනීම

- එනම් උදුරා ගැනීමෙන් හෝ සොරකම් කිරීමෙන් ලබා ගැනීමයි.

3. හිගමන් ඉල්ලිම

- පරිත්‍යාගශීලින් ගෙන් ඉල්ලා සිටීමයි.

4. හුවමාරුව

- වටිනාකමක් ඇති දෙයක් දෙපාර්ශවයක් අතර ගනුදෙනු කිරීමෙන් අවශ්‍යතාසපුරා ගැනීමයි.

## නිෂ්පාදිතය.

මිනිස් අවශ්‍යතාහා වුවමනා තෘප්තිමත් කරන වෙළෙඳපොළ ඉදිරිපත් කරන ඕනෑම දෙයක් නිෂ්පාදිතයකි.

නිෂ්පාදනය තුළින් මිනිස් අවශ්‍යතාහා වුවමනා සපුරා ගනු ලබයි. නිෂ්පාදිත ප්‍රධාන වශයෙන් භාණ්ඩ හා සේවා ලෙස වර්ග කළ හැකියි.

## භාණ්ඩ හා සේවා

භාණ්ඩ

මිනිස් අවශ්‍යතාහා වුවමනා සපුරා ගනු ලබන ඇසට පෙනෙන එමෙන්ම භෞතිකව ස්පර්ශ කල හැකි දෑ.

සේවා

එක් පාර්ශවයකින් තවත් පාර්ශවයකට ඉදිරිපත් කළ හැකි ක්‍රියාකාරකම්.

## සේවා වල ලක්ෂණ

01. භෞතික පැවැත්මක් නොමැති බව / අස්පෘශ්‍යතාවය.

- සේවාවක් මිලදී ගැනීම්ට පෙර දැකිය නොහැක.

02. සපයන්නා  ගෙන් වෙන්  කළ නොහැකි වීම.

- සේවාවක් එය  සපයන්නාගෙන් වෙන් කළ නොහැකි වීමයි.

03. ගබඩා කළ නොහැකි වීම.

- සේවාවක් පසුව විකිණීමට හෝ භාවිතයට ගබඩාකර තබාගත නොහැකි බවයි. සේවාවේ වටිනාකමක් ඇති වන්නේ සේවාව සපයන කාලය තුළදීයි.

04. විවිධත්වය

- සේවා සපයන්නේ කවුරුන්ද? ඒ සපයන්නේ කවදාද? කෙසේද? යනාදිය මත සේවාවේ ගුණාත්මක හා ක්‍රියාකාරීත්වය වෙනස් වන බවයි.

## භාණ්ඩ හා සේවා වල ඇති වෙනස්කම්

| භාණ්ඩ | සේවා |
|---|---|
| භෞතික පැවැත්මක් ඇත. | භෞතික පැවැත්මක් නොමැති බව. |
| ගබඩා කළ හැකි වීම. | ගබඩා කළ නොහැකි වීම. |
| සපයන්නා ගෙන් වෙන් කළ හැකි වීම. | සපයන්නා ගෙන් වෙන් කළ නොහැකි වීම. |
| සමජාතිය වන පරිදි නිෂ්පාදනය කළ හැක | සපයන්නා අනුව වෙනස් වේ. |

## භාණ්ඩ වර්ගීකරණය

භාණ්ඩ ඒවායේ ඇති ලක්ෂණ අනුව පදනම් කීපයක් යටතේ වර්ග කළ හැකිය

01) භාවිතය අනුව

- පාරිභෝගික භාණ්ඩ
- ප්‍රාග්ධන භාණ්ඩ

02) කල් පැවැත්ම අනුව

- කල් පවතින භාණ්ඩ
- කල් නොපවතින භාණ්ඩ

### පාරිභෝගික භාණ්ඩ

- අවසාන පාරිභෝගිකයා විසින් පරිභෝජනයය සඳහා මිලදී ගන්නා භාණ්ඩ පාරිභෝගික භාණ්ඩ ලෙස හඳුන්වයි
- කිසියම් අවස්ථාවකවකදී පාරිභෝගික භාණ්ඩ භාවිතයෙන් කෙළවර වේ. ඒ නිසා නැවතත් අලුත් භාණ්ඩ එක් කළ යුතුය.

**පාරිභෝගික භාණ්ඩ වර්ගීකරණය**

මිලදී ගැනීමට දරන ප්‍රයත්නය අනුව පාරිභෝගික භාණ්ඩ ප්‍රධාන වර්ග හතරකට බෙදා දැක්වේ.

01. පහසු භාණ්ඩ

මිලදී ගැනීම්ට ඉතා සුළු ප්‍රයත්නයක් දරන අඩු මිලක් සහිත පාරිභෝගිකයා නිරන්තරයෙන් මිලදී ගන්නා භාණ්ඩ වේ. මේවායේ ජීව කාලය කෙටිය.

උදාහරණ - සබන්

දන්තාලේප

02. සාප්පු භාණ්ඩ

මිල ගුණාත්වය සන්නම මෝස්තරය පෙනුම් යනාදි ලක්ෂණ සසඳා බලමින් සැලකිය යුතු ප්‍රයත්නයක් දරා මිලදී ගන්නා භාණ්ඩ වේ. මේවා කාල පරතරයක් යටතේ මිලට ගනියි. සාපේක්ෂ වශයෙන් මිල තරමක් ඉහළලය.

උදාහරණ - පාවහන්

සුවඳ විලවුන්

03. විශේෂිත භාණ්ඩ

මිලට ගැනීම්ට විශාල කාලයක් හා ශ්‍රමයක් දරනු ලබන භාණ්ඩ වේ. මේවා දිගු කාලයකට වරක් මිලදී ගැනේ. මෙම භාණ්ඩ වල මිල ඉතා ඉහල වේ. මෙවැනි භාණ්ඩ බෙදා හාරන ස්ථානද සීමාසහිතය. බෙදාහැරීම්ද සීමාසහිතය.

උදාහරණ - මෝටර් රථ

04. නොසෙවූ භාණ්ඩ

විකිණීම සඳහා වෙළඳ වෙළඳ පොලේ ඇති, එහෙත් ඒ බව පාරිභෝගිකයින් නොදන්නා, එසේම මිලට ගැනීමට ප්‍රයත්නයක් නොදරන භාණ්ඩ වේ.

උදාහරණ

ජීවිත රක්ෂණ ඔප්පු

පොත්පත්

**කාර්මික භාණ්ඩ**

- පාරිභෝගික භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා හෝ ව්‍යාපාර ආයතනයේ ආයෝජනය සඳහන් මිලදී ගන්නා දෑ කාර්මික භාණ්ඩ වේ.
- ඒවා ව්‍යාපාරික නැතහොත් ප්‍රාග්ධන භාණ්ඩ ලෙස ද හැඳින්වේ.
- ව්‍යාපාරික භාණ්ඩ පාරිභෝගික භාණ්ඩ වලින් වෙනස් වන ප්‍රධානතම ලක්ෂණය වන්නේ ගැනුම්කරු හෝ විකුණුම්කරුගේ චේතනාවයි.
- ඒ අය අනුව අප අවසාන පරිභෝජනය සඳහා නම් එය පාරිභෝගික භාන්ඩයකි. වෙනත් භාණ්ඩයක් නිපදවීම සඳහා නම් එය කාර්මික භාණ්ඩයකි.

**කාර්මික භාණ්ඩ වර්ගය වර්ගීකරණය.**

01. ද්‍රව්‍ය හා ද්‍රව්‍ය හා කොටස්

- ව්‍යාපාරික කටයුතුවලදී ප්‍රයෝජනයටයට සඳහා ගන්නා අමුද්‍රව්‍ය සහ නිෂ්පාදන ද්‍රව්‍ය වේ.

අමුද්‍රව්‍ය - දැව ඛනිජ

නිෂ්පාදන ද්‍රව්‍ය - යකඩ සිමෙන්ති

කොටස් අමතර කොටස් වර්ග

02. ප්‍රාග්ධන අයිතම

- පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනයට හා නිෂ්පාදන කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය ස්ථාවර වත්කම්.

උදාහරණ - කර්මාන්තශාලා ගොඩනැගිලි.

යන්ත්‍ර උපකරණ.

03. සැපයුම් හ ව්‍යාපාරික සේවා

ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය සුළු ද්‍රව්‍ය හා විවිධ වූ සේවා.

උදාහරණ - ඉන්ධන

ලිපිද්‍රව්‍ය

විදුලි බලය

ජලය

සේවා වර්ග කිරීම්

01. ඍජු සේවා

සේවා සැපයුම්කරු විසින්ම සපුරා ගනු ලබන සේවාවේ එනම් පුද්ගලයෙක් තවත් පුද්ගලයෙකුට හෝ කණ්ඩායමකට අතර අතරමැදියන් සම්බන්ධ කර නොගෙනම සපයන සේවා.

උදාහරණී වෛද්‍ය සේවා උපදේශන සේවා

02. වක්‍ර සේවා

ව්‍යාපාර කටයුතු වලට පහසුකම් සලැසෙන සේවා

උදාහරණ - බැංකු

රක්ෂණ

සන්නිවේදන

## වෙළෙඳපොළ

ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් මුණගැසෙන හෝ සම්බන්ධ වන ඕනෑම තත්ත්වයක් වෙළෙඳ පොළක් ලෙස හඳුන්වයි.

නැතහොත්

පාරිභෝගික අවශ්‍යතාහා වුවමනා තෘප්තිමත් කරගැනීම පිණිස භුවමාරුවට සම්බන්ද වීමට කැමති සහ ක්‍රය ශක්තිය ඇති සත්‍ය හා විභව ගනුදෙනුකරුවන් සියල්ලන්ගේ එකතුවකි.

වෙළඳපොලේ විකාශනය

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය වර්ධනය නිසා වෙළඳපොළ ස්ථානය වර්තමාන වෙළෙඳපොළ අවකාශයක් බවට පත් වී ඇත.

ඒ අනුව අද වෙළෙඳපොළ භෞතික වශයෙන් මෙන්ම විද්‍යුත් ක්‍රම හරහා ද ක්‍රියාත්මක වේ.

වෙළඳපොළ ස්ථානය

ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් මුණගැසෙන සහ භාණ්ඩ හා සේවා අලෙවි කරණ නිශ්චිත ස්ථානය වෙළඳපොලයි. භෞතික ස්ථානයකි.

උදාහරණ - සති පොලි සුපිරි වෙළඳසැල්

## වෙළෙඳපොළ අවකාශය.

- ඩිජිටල් මාධ්‍ය , අන්තර්ජාලය හරහා ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් සම්බන්ධ වන ඕනෑම අවස්ථාවකි.

වෙළෙඳපොළ ස්ථානය හා වෙළඳපල අවකාශය අතර ඇති සමානකම්

1. හුවමාරුවක් සිදු වීම

2. පාර්ශව දෙකක හෝ වැඩි ගණනක් සිටීම

3. මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුවීම

<u>වෙළෙඳපොළ ස්ථානය හා වෙළඳපල අවකාශය අතර ඇති අසමානකම්</u>

| වෙළෙඳපොළ ස්ථානය | වෙළඳපල අවකාශය |
|---|---|
| භෞතික ස්ථානයක් ඇත | භෞතික ස්ථානයක් නොපැවතීම |
| විද්‍යුත් මාධ්‍ය මගින් සිදු නොවීම | විද්‍යුත් මාධ්‍ය මගගින් සිදු වීම |
| නිෂ්පාදිත භෞතික පරීක්ෂාව සිදු කරයි | භෞතික පරීක්ෂාව සිදු නොකෙරේ |
| බොහෝ විට පැය විසි 24 ම ක්‍රියාත්මක නොවේ | 24 පැය ක්‍රියාත්මක වේ |
| වෙළඳපොළ ස්ථානය සීමා සහිතයි | අවකාශය පුළුල් |

## ව්‍යාපාර වල දැකිය හැකි ලක්ෂණ

01. විකුණුම් හෝ හුවමාරුවක් සිදු වීම.

- සෑම ව්‍යාපාරයක්ම භාණ්ඩ හා සේවා මුදල්මය අගයක් මත විකිණීම හෝ හුවමාරු කිරීම් සිදු කෙරේ. භාණ්ඩ හා සේවා මිලක් මත මිලදී ගැනීම් හා විකිණීම ව්‍යාපාරවල අත්‍යාවශ්‍ය සාධකයකි. විකිණීමක් හුවමාරුවක් හෝ නොමැති තැන් ව්‍යාපාර කටයුත්තක් සිදු නොවේ.

02. භාණ්ඩ හා සේවා ගනුදෙනු වීම්.

- සෑම ව්‍යාපාරයක්ම අන් අයට විකිණීම සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සහ මිලදී ගැනීම් සිදුකරයි. ඒවා පාරිභෝගික භාණ්ඩ හෝ කාර්මික භාණ්ඩ හෝ සේවා විය හැකියි.

03. ගනුදෙනුව අඛණ්ඩව සිදු වීම.

- අඛණ්ඩ පදනමක් මත දිගින් දිගටම භාණ්ඩ හා සේවා ගනුදෙනු සිදු කරයි නම් එය ව්‍යාපාරයක් ලෙස හඳුන්වයි. එක් ගණුදෙනුවක් පමණක් සිදු කරයි නම් එය ව්‍යාපාරයක් නොවේ.

04. ලාභයෙන් අභිප්‍රේරණය වීම.

- ව්‍යාපාරයක මූලික අරමුණ මුදල් ඉපයීම් හා ධනය අත්පත් කර ගැනීමයි. ලාභ නොලබන අරමුණක් නොවන ව්‍යාපාරයක් දිගුකල් රඳා නොපවතී. ව්‍යාපාරයක වර්ධනය සහ ප්‍රසාරණය සඳහාද ලාභය අත්‍යවශ්‍ය වේ.

05. අවදානමක් තිබීම

- ලාභ ලැබීමට ඇති අවිනිශ්චිතතාවය හා අලාභ සිදු වීමට ඇති හැකි හැකියාව යන අවදානම් ව්‍යාපාරය තුළ දැකිය හැකිය. ව්‍යාපාර වලට ප්‍රායෝගිකව පාලනය කර නොහැකි විවිධ සාධක නිසා අවදානම නැතහොත් අවිනිශ්චිතතා ඇතිවේ. ව්‍යාපාර නිරන්තරයෙන් අවදානම් වලට මුහුණ දේ.

01. මිනිස් අවශ්‍යතාහා වුවමනා සපුරාලීම

- භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කර පුද්ගල අවශ්‍යතා හා වුවමනා සම්පූර්ණ කිරීම.

02. සම්පත් වලට අගය එකතු කිරීම

- භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනයේ දී යොදාගන්නා සම්පත් වල ස්වරූපය වෙනස් කිරීම් මගින් ඇතිවන අගය වැඩි කිරීම එකතු කළ අගය ලෙස හැඳින්වේ.
- නිෂ්පාදනය ව්‍යාපාර විසින් කරනුයේ සම්පත් වල ස්වරූපය වෙනස් කිරීම්යි.
- එමගින් එම සම්පත් වල අගය වැඩි වේ. මෙලෙස සම්පත් වලට අගයකුත් කිරීම ව්‍යාපාරයක සිදුවන ප්‍රධාන කටයුත්තකි.

## ව්‍යාපාර පරමාර්ථ / අරමුණු

1. වෙළෙඳපොළ තුළ රැඳී සිටීම

2. ලාභ උපරිම කිරීම

3. විකුණුම් උපරිම කිරීම්

4. වෙළඳපොල කොටස උප උපරිම කිරීම්

5. පාරිභෝගික තෘප්තිය

6. සේවක සුභසාධනය

## ව්‍යාපාරයක අරමුණුක තිබිය යුතු මූලික ගුණාංග

1. නිශ්චිත වීම
2. මැනිය හැකි වීම
3. ළඟා කරගත හැකිවීම
4. යථාර්ථවාදී බව
5. කාල රාමුව තිබීම

## ආර්ථිකයක පැවැත්මට ද ව්‍යාපාරවල දායකත්වය

1. විදේශ විනිමය ඉපැයීමට
2. ප්‍රාදේශීය සංවර්ධනයට
3. රැකියා උත්පාදනය
4. නවෝත්පාදන බිහි කිරීම

## ව්‍යාපාර විකාශනය හා ප්‍රවණතා අධ්‍යනය කිරීම

## ව්‍යාපාර විකාශනය

ඈත අතීතයේදී ස්වයංපෝෂිත අර්ථ ක්‍රමයක් පැවැති අතර එම අර්ථ ක්‍රමය තුළ තමාට අවශ්‍ය දේ තමාම නිෂ්පාදනය කර ගන්නා ලදී. එය සෘජු නිෂ්පාදනය ලෙස හඳුන්වයි එම යුගයේදී එක් එක් පුද්ගලයා හා පුද්ගල කණ්ඩායම් ඔවුනට සුවිශේෂී නිෂ්පාදනයක් සිදු කිරීම නිසා එම නිෂ්පාදනය පිළිබඳව විශේෂඥතාවයක් ඇතිවිය. එය පුද්ගල විශේෂීකරණය ලෙස හැඳින්වූ අතර එහි ප්‍රතිඵලය ලෙස අතිරික්ත නිෂ්පාදනය බිහිවිය. පසුකාලීනව අතිරික්ත නිෂ්පාදනය වෙනත් භාණ්ඩ නිෂ්පාදනය කරන අය සමඟ හුවමාරු කර ගත්හ. මේ භාණ්ඩ හුවමාරුව ලෙස හැඳින්වූ අතර ඒ තුළින් වෙළඳාම පැන නැගුණි.

ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය පැහැදිලි කිරීම්

- රටට අවශ්‍ය කරන සියලු භාණ්ඩ හා සේවා එම රට තුළම නිෂ්පාදනය කෙරෙන තත්ත්වයයි.
- එනම් රටේ සියලු පුරවැසියන් ගේ අවශ්‍යතා හා වුවමනා එම් රට තුලින්ම සපයා ගැනීමයි.

ස්වයංපෝෂිත අර්ථ ක්‍රමයයක  දැකිය හැකි මූලිකම ලක්ෂණ දෙකකි.

- සෘජු නිෂ්පාදනයය
- පුද්ගල / රැකියා විශේෂීකරණය

සෘජු නිෂ්පාදනයය සහ වක්‍ර  නිශ්ෂ්පාදනය

- සෘජු නිෂ්පාදනය

පුද්ගලයා තමාාට අවශ්‍ය  දෑ තමා විසින්ම නිෂ්පාදනයය කර ගැනීම.

- වක්‍ර  නිෂ්පාදනය

වෙළෙඳපොළ සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම

එනම් වෙළඳ වෙළෙඳපොළ මුල් කරගෙන කිසියම් පුද්ගලයෙක් භාණ්ඩ, සේවා හෝ අදහස් නිෂ්පාදනයයි.

සෘජු නිෂ්පාදනය සහ වක්‍ර  නිශ්පාදනය අතර වෙනස්කම්

| සෘජු නිෂ්පාදනය | වක්‍ර නිශ්පාදනය |
|---|---|
| තමාට අවශ්‍ය  දෑ තමා විසින්ම නිෂ්පාදනයය කර ගැනීම | වෙළෙඳපොළ සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම |
| සුළු පරිමාණයෙන් නිෂ්පාදනය සිදු කිරීම | මහා පරිමාණ නිෂ්පාදන සිදු කිරීම |
| ලාභ සංකල්පයක් නොමැත | ලාභ සංකල්පයක් දැකිය හැක |
| වෙළෙඳාමක් හුවමාරුවක් දැකිය නොහැක | වෙළඳාම් හුවමාරුව සඳහා වෙයි |
| | |

## ව්‍යාපාර වල ක්‍රමික විකාශනය

1. භාණ්ඩ හුවමාරුව

- නිෂ්පාදනය වෙනත් අතිරික්ත නිෂ්පාදන සමග හුවමාරු කර ගැනීම් භාණ්ඩ හුවමාරුව නම් වේ.
- ව්‍යාපාර  විකාශනයේ මුල් ම අවස්ථාවව භාණ්ඩ හුවමාරු ක්‍රමය වේ.
- භාණ්ඩ හුවමාරුව සමග වෙළඳාම පැන නැගුනි එමගින් වක්‍ර  නිශ්පාදනය ද බිහිවෙයි.

2. මුදල් භාවිතය

- භාණ්ඩ හුවමාරු ක්‍රමයේ පැවති දුර්වලතා මග මගහරවා ගැනීම සඳහා හුවමාරු මාධ්‍ය  ලෙස විවිධ ද්‍රව්‍ය භාවිත කළේය. මේවා මුදල් ලෙස සැලකෙන අතර මුදල් භාවිතය ව්‍යාපාර විකාශනය දෙවන අවස්ථාව වේ.

3. කාර්මික විප්ලවය

- යුරෝපීය රටවල් ඇති වූ කාර්මික ප්‍රබෝධය සමග මෙතෙක් පැවැති ගෘහ කර්මාන්ත මහා පරිමාණ කර්මාන්ත බවට පත් වූ අතර ඒ සමග වෙළදාම් ප්‍රසාරණයක් සිදුවිය. එසේම උපකාරක සේවා වල ද වර්ධනයක් සිදුවිය
- මෙම යුගයේ වාණිජ බිඳවැටීම සිදුවිය කාර්මික විප්ලවය ව්‍යාපාර විකාශනය තුන්වන අවස්ථාව වේ.

4. තොරතුරු  යුගය / දැනුම් ආර්ථිකය

- වර්තමානයේ පවතින්නේ විද්‍යුත්  වාණිජ්‍ය  හා විද්‍යුත් ව්‍යාපාර මත පදනම් වූ යුගයක් වන අතර මෙම යුගයේ පවතින විශේෂත්වය වන්නේ තොරතුරු මත ව්‍යාපාර පදනම්ව තිබීමයි. තොරතුරු යුගය ව්‍යාපාර විකාශනයේ 4 වන අවස්ථාව වේ

භාණ්ඩ හුවමාරුව

- මිනිස් අවශ්‍යතාසපුරා ගැනීම උදෙසා එක් පාර්ශවයක් සතු භාණ්ඩයක් හෝ සේවාවක් වෙනත් පාර්ශවයක් සතු භාණ්ඩයක් හෝ සේවාවක් සමග සෘජුව හුවමාරු කර ගැනීමයි.
- අතිරික්ත භාණ්ඩ නිෂ්පාදනය නිසා භාණ්ඩ හෝ හුවමාරුව බිහිවිය.
- වෙළඳාමට පදනම වූයේ මෙම අතිරික්ත භාණ්ඩ හුවමාරුව.

<u>භාණ්ඩ හුවමාරු ක්‍රමයයේ පැවති දුර්වලතා</u>

- සමානුපාතය නොපැවතීම
- භාණ්ඩ කුඩා කොටස්වලට බෙදීි මේ අපහසුතාවය
- වටිනාකම් මැනිය මේ අපහසුතාවය
- භාණ්ඩ රැස්කර තබා ගැනීමේ අපහසුතාවය
- ප්‍රවාහන අපහසුතාතාවය

## මුදල්

භාණ්ඩ හා සේවා හුවමාරු වේ දී පොදුවේ පිළිගනු ලබන ඕනෑම මාධ්‍යයක් මුදල් ලෙස හැඳින්වේ.

<u>මුදල් විකාශනයේ අදියර</u>

01. ද්‍රව්‍ය  භාවිතය

භාණ්ඩ හුවමාරු ක්රමයේ පැවති දුර්වලතා නිසා හුවමාරු මාධ්‍යයක් ලෙස ඉක්මනින් නශ්‍ය  නොවන විවිධ ද්‍රව්‍ය භාවිතා කෙරුණි

උදාහරණ - සිප්පිකටු

දුම්කොළ

ඇත් දළ

02. ලෝහ වර්ග භාවිතය

ද්‍රව්‍ය භාවිතයේ පැවති දුෂ්කරතා නිසා යකඩ, තඹ, රිදී වැනි ලෝහ කැබලි භාවිතා කෙරුණි.

03. ලෝහ කාසි මුදල් භාවිතය

විවිධ ප්‍රමාණ ප්‍රමාණවලින් යුතු ලෝහ කැබලි වල බර, පිරිසිදු බව, අගයන් ආදී මුහුණතෙහි සඳහන් කර නිකුත් කළ විවිධ කාසි භාවිතා කරන ලදී.

04. කාසි හා නෝට්ටු මුදල් භාවිතය

වටිනා ලෝහ වර්ග වල හිඟතාවය නිසා රජයේ බලයලත් අධිකාරිය විසින් නිකුත් කරන ලද කාසි හා නෝට්ටු භාවිතය ආරම්භ විය.

05. බැංකු මුදල් භාවිතය

බැංකු ජංගම ගිණුම් ආශ්‍රිතව ගෙවීමේ උපකරණ භාවිතය.

06. ඉලෙක්ට්‍රොනික් මුදල් භාවිතය

තොරතුරු හා ඩිජිටල් තාක්ෂණයේ දියුණුවත් සමග හඳුන්වාදුන් පරිගණක ජාලයක් මගින් ගනුදෙනු සිදුවන කාඩ් විශේෂයයි.

## කාර්මික විප්ලවය

18 වන සියවසේ මැද භාගයේ සිට දහනමවන සියවස මුල් භාගයේ තෙක් එංගලන්තය සහ යුරෝපයේ රටවල් වල කර්මාන්ත ක්ෂේත්‍රයේ ඇති වූ මූලික විපර්යාසයයි. නිෂ්පාදක ක්‍රියාවලියේ ඇති වූ පරිවර්තනය.

මෙහිදී මූලික වෙනස්කම් දෙකක් ඇති විය

01. නිෂ්පාදන කටයුතු සඳහා පැවැති ගෘහ ක්‍රමය වෙනුවට කම්මල් කර්මාන්තශාලා ක්‍රමය මහා පරිමාණ නිෂ්පාදනය ඇරඹීම

02. අත්ක්‍රමය සිදුකර නිෂ්පාදන කටයුතු සඳහා යන්ත්‍ර උපකරණ භාවිතය

කාර්මික  විප්ලවය නිසා නිෂ්පාදනයට වෙළඳාමට හා සමාජයට සිදු කළ බල බලපෑම්

නිෂ්පාදනයට

- ගෘහ වෙනුවට කම්හල් ක්‍රම පිහිටුවීම
- සුළු පරිමාණ නිෂ්පාදනය මහා පරිමාණ වීම්
- යන්ත්‍ර  භාවිතය වෙනුවට නව ශිල්ප ක්‍රම බිහිවීම
- කළමනාකරණ ශිල්ප ක්‍රම භාවිතා කිරීම

වෙළඳාමට

- කිරුම් මිනුම් උපකරණ බිහිවීම
- ගබඩා කිරීමේ නව ක්‍රම  බිහිවීම
- විදේශ වෙළඳාම බිහිවීම
- සේවා අංශය වර්ධනය
- දේශීය වෙළඳාම පුළුල් වීම

සමාජයට

- සේවා නියුක්තිය අවකාශ වැඩිවීම.
- ආර්ථික ක්‍රමය කෘෂි කෘෂිකර්ම කෘෂිකර්මාන්ත අංශයේ සිට කර්මාන්ත අංශයට පැමිණීම
- නාගරීකරණය
- ජනගහන වර්ධනය
- ජීවන තත්ත්වය උසස් වීම

## විශේෂීකරණය

භාණ්ඩ භාණ්ඩ හා සේවා වල සීමිත පරාසයක් පුද්ගලයෙක් විසින් හෝ ආයතනයක් විසින් හෝ ප්‍රදේශයක් විසින් හෝ රටක් විසින් නිෂ්පාදනය කිරීම විශේෂී කරන ලෙස සැලකේ

ප්‍රභේද හතරකි

01. කාර්ය / රැකියා / පුද්ගල විශේෂීකරණය

02. ආයතනික භාණ්ඩ විශේෂීකරණය

03. ප්‍රාදේශීය විශේෂීකරණය

04. ජාතික විශේෂීකරණය

01. කාර්ය / රැකියා / පුද්ගල විශේෂීකරණය

පුද්ගලයකු තම දක්ෂතා හා හැකියාව මත තමාට වඩා හොඳින් කළ හැකි කාර්යයක දිගින් දිගටම නිරත වීම තුළින් එම කාර්යය පිළිබඳ ඇතිවන විශේෂ දක්ෂතාවය හෝ නිපුනණතාව පුද්ගල විශේෂීකරණය.

උදාහරණ - වඩු කාර්මිකයා

නීතිඥවරයා

<u>පුද්ගල විශේෂීකරණයේ වාසි</u>

ව්‍යාපාරයට

- නිෂ්පාදන ප්‍රමාණය ඉහළ යාම
- නිමැවුමේ ගුණාත්වය ඉහළ යාම
- ප්‍රාග්ධනය උපකරණ පිරිමැසුම්දායි ලෙස භාවිතා කළ හැකි වීම
- නිෂ්පාදනය කාලය ඉතුරු වීම
- ශ්‍රම ඵලදායීතාවය වැඩි වීම
- කාර්යක්ෂමතාව ඉහළ යාම

සේවකයාට

- කාර්ය පිළිබඳව වූ විශේෂඥතාවයක් ඇතිවීම
- සේවකයාගේ ඵලදායිතාවය වැඩි වීම
- ඉපැයීම් ඉහළ යාම
- රැකියාව ඉගෙන ගැනීම්ට ගත කළ යුතු කාලය අවම වීම

<u>පුද්ගල විශේෂීකරණය අවාසි</u>

ව්‍යාපාරයට

- එක් සේවකයෙකුගේ හෝ කණ්ඩායමක ප්‍රමාදය නිසා මුළු නිෂ්පාදනය ම අඩාල වීම
- අධි විශේෂීකරණය නිසා සේවක චලනය අපහසු වීම
- ආයතනය තුළ" අන්තර් පුද්ගල සම්බන්ධතා අඩුවීම
- සේවක වෙහෙස ඉහළ යාම

සේවකයාට

- රැකියාව නීරස වීම නිසා ඵලදායිතාවය අඩුවීම
- වෘත්තීය ලෙඩරෝග වැළදීම
- කුසලතා සීමා වීම
- රැකියාව අහිමි වුවහොත් වෙනත් රැකියාවක් සොයා ගැනීමට අපහසු වීම

02. ආයතනික භාණ්ඩ විශේෂ විශේෂීකරණය

- ආයතනයක් යම් භාණ්ඩයක් නිපදවීම සම්බන්ධයෙන් සාපේක්ෂව කාර්යක්ෂමතාවක් දක්වයි නම් එය භාණ්ඩ විශේෂීකරණයයි

03. ප්‍රාදේශීය විශේෂයක විශේෂීකරණය

- කිසියම් ප්‍රදේශයක් නිශ්චිත භාණ්ඩයක් හෝ සේවාවක් නිපදවීම් සම්බන්ධයෙන් වැඩිපුර ප්‍රවණතාවක් දක්වයි නම් එය ප්‍රාදේශීය විශේෂී විශේෂීකරණය

04. ජාතික විශේෂීකරණය

- රටක් යම් භාණ්ඩයක් නිපදවීම සම්බන්ධව ඉහළ කාර්යක්ෂමතාවයක් දක්වයි නම් එය ජාතික විශේෂීකරණය

ශ්‍රම **විභජනය**

- එක් එක් සේවකයාට පහසුවෙන් ඉටු කළ හැකි වන ආකාරයට සමස්ත කාර්යයන් කුඩා හා සරළ කොටස් වලට වෙන් කිරීම ශ්‍රම විභජනය

වාණිජ්‍ය

- නිෂ්පාදකයාගේ සිට පාරිභෝගිකයා දක්වා භාණ්ඩ හා සේවා හුවමාරුවට අදාළ සමස්ත ක්‍රියාවලිය වාණිජ්‍ය

මෙය ප්‍රධාන කොටස් දෙකකි

01 වෙළඳාම්

02 උපකාරක සේවා

## වෙළඳාම

ගැණුම්කරුවෙකු හා විකුණුම් කරුවෙක් අතර කිසියම් ප්‍රතිෂ්ඨාවකට නිෂ්පාදිණුම් කරුවෙකු අතර කිසියම් ප්රතිෂ්ඨාවකට නිෂ්පාදිත භාණ්ඩ හා සේවා වල අයිතිය හුවමාරු වීමේ ක්‍රියාවලිය වෙළඳාම නම් වේ.

භාණ්ඩ හා සේවා මිලට ගැනීම හා විකිණීම වෙළෙඳාමයි. හිමිකම් මාරුවීමත් සමග ගැනුම්කරු හා විකුණුම්කරු අතර නිෂ්පාදිත හුවමාරු වීමේ ක්‍රියාවලිය යි

වෙළඳාමේ අතීත ස්වරූපය හා වර්තමාන ස්වරූපය සැස සැසඳීම්

| අතීත ස්වරූපය | වර්තමාන ස්වරූපය |
|---|---|
| භෞතික වෙළඳ වෙළඳපොලක් තුළ වෙළඳාම සිදුවීම් | භෞතික වෙළඳ වෙළෙඳපොළ මෙන්ම ඉලෙක්ටොනික වෙළඳපොලක් දැකිය හැක |
| භාණ්ඩ හුවමාරුව තුලින් වෙළඳදාම සිදුවීම් | මුදල් භාවිතා කරමින් එක් සිදුවිය |
| බොහෝ විට රට තුළට වෙළඳාම් සීමා වීම | අන්තර්ජාතික එක් දක්වා එය පුළුල් ය |
| වෙළඳාමේ දී දැඩි තරගයක් ඇති නොවීම | වෙළඳාමේ දැඩි තරගයක් දැකිය හැක |
| මූලික අවශ්‍යතාසඳහා වූ සීමිත භාණ්ඩ ප්‍රමාණයක් වෙළඳාම් විය | පුළුල් නිෂ්පාදිත පන්තියක් වෙළඳාම් වේ |

## උපකාරක සේවා

- ව්‍යාපාර කටයුතුවලට පහසුකම් සලසන සේවාව වේ
- එනම් වෙළඳාමේ වර්ධනයට ඉවහල් වන සේවාවේ. මේ තුළින් ගනුදෙනුකරුවන්ට හා අලෙවිකරුවන්ට ව්‍යාපාර ගනුදෙනු වලදී පහසුකමක් සැලසේ

ඉලෙක්ට්රොනික වෙළඳාම

භාණ්ඩ හා සේවා මිලදී ගැනීම හා විකිණීම කටයුතු අන්තර්ජාලය ප්‍රමුඛ පරිගණකගත තොරතුරු පද්ධති හරහා සිදු කිරීම

ඉලෙක්ට්‍රොනික් වෙළඳාමේ

වෙළඳ කටයුතු හා වෙළඳාම්ට සහාය වන ප්‍රවාහන, සන්නිවේදන, බැංකු, ගබඩාකරණය වැනි උපකාරක සේවා කටයුතු ද අන්තර්ජාලය ඔස්සේ සිදු කිරීම ඉලෙක්ට්‍රොනික් වාණිජ්‍යයි.

මෙහිදී වෙබ් අඩවිය හරහා භාණ්ඩ හා සේවා ඇනවුම් කර බොහෝවිට ණයපත් හරහා ගෙවීම් සිදු කළ හැක.

ඉලෙක්ට්‍රොනික් වෙළඳාමේ වර්තමානය ප්‍රචලිත වීමට හේතු

- ලියකියවිලි වලින් තොරව ව්‍යාපාර තොරතුරු හුවමාරු කිරීමට හැකිවීම
- ව්‍යාපාර කටයුතු වේගවත් වීම
- මෙහෙයුම් පිරිවැය, තොග පිරිවැය අඩුවීම
- ගෝලීය වූ වෙළෙඳපොළ අවකාශයක් බිහිවීම
- පරිගණක සුරක්ෂිතතාවය වැඩිවීම
- ගනුදෙනුකරුවන්ගේ කාලය හා ශ්‍රමය ඉතිරි වීම

ඉලෙක්ට්‍රොනික් ව්‍යාපාර

ව්‍යාපාර වලට අදාල සියළුම කාර්යයන් අන්තර් අන්තර්ජාලය හරහා සිදු සිදු කිරීම.

නැතහොත්

වෙළඳාමේ, බෙදාහැරීම, මූල්‍ය කටයුතු, පරිපාලන කටයුතු ආදී සියලුම ව්‍යාපාර කටයුතු අන්තර්ජාලය යොදා ගනිමින් සිදු කිරීම

ඉලෙක්ට්‍රොනික් ව්‍යාපාර හා ඉලෙක්ට්‍රොනික් වාණිජ්‍ය අතර වෙනස්කම්

| ඉලෙක්ට්‍රොනික් ව්‍යාපාර | ඉලෙක්ට්‍රොනික් වාණිජ්‍ය |
|---|---|
| මේ සඳහා සියලුම කාර්යයන් අයත් වේ. වෙළඳාමේ, මානව සම්පත්, නිෂ්පාදන පර්යේෂණ හා සංවර්ධන. | මෙයට මිලදී ගැනීම් හා විකිණීම් සම්බන්ධ ක්‍රියාකාරකම් පමණක් අයත් වේ |
| පුළුල් සංකල්පයකි | පටු සංකල්පයකි |
| ඉලෙක්ට්‍රොනික් ව්‍යාපාර සාපේක්ෂ වශයෙන් අභ්‍යන්තර නැඹුරුවක් ඇත | ඉලෙක්ට්‍රොනික් වාණිජ්‍ය සාපෙක්ෂ වශයෙන් බාහිර නැඹුරුවක් ඇත |
| ගනුදෙනුකරුවන් සැපයුම්කරුවන් සමග ඇති සම්බන්ධතා මත පදනම් වී ඇත | ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන්, කළමනාකරුවන්, සේවකයින්, රජය ආදී උනන්දුවක් දක්වන පාර්ශව සමග ඇති සම්බන්ධතා මත පදනම් වී ඇත |

## ව්‍යාපාර වල නව ප්‍රවණතා

- ගෝලියකරණය ව්‍යාප්ත වීම
- ඉලෙක්ට්රොනික් ව්‍යාපාර බිහිවීම්

- පරිසරය පිළිබඳ සැලකිලිමත් වීම
- හරිත නිෂ්පාදන කරා යොමු වීම
- තිරසර සංවර්ධනයට යොමු වීම
- තාක්ෂණික වර්ධනය
- ඩිජිටල් තාක්ෂණය වර්ධනය

නව ප්‍රවණතා මගින් ව්‍යාපාර වල සිදුවී ඇති වෙනස්කම්

- නොනිදන නොවැසුණු ව්‍යාපාර බවට පත්වවීම
- ව්‍යාපාර ප්‍රමාණය කුඩා වීම සහ භෞතික ස්ථාන නොමැතිවීම
- අවකාශ වෙලඳපොලක කටයුතු කිරීම්
- ව්‍යවහාර මුදල් රහිතව ගනුදෙනු කිරීමට පෙළඹවීම
- විවිධ ජාතීන් හා විදේශිකයින් සේවා නියුක්ත ව සිටීම

## ගෝලීයකරණය

ලෝකයේ රටවල් අතර ආර්ථික සමාජීය හා සංස්කෘතික වශයෙන් ඇති අන්‍යෝන්‍ය බැඳීම්.

ගෝලීයකරණය වාසි

- පුළුල් වෙළඳපොළක් නිර්මානය වීම
- නවතා තාක්ෂණය ගලා ඒම
- නව දැනුම් හුවමාරු වීම්
- නව්‍යතා සම්පාදනයට වැඩි ඉඩකඩක් ලැබීම්
- විදේශ විනිමය ඉපයීමට හැකි වීම

ගෝලීයකරණයේ අවාසි

- ගෝලීය තරගයට මුහුණ දිය යුතු වීම
- සාම්ප්‍රදායික කර්මාන්ත අඩපන වීම්
- දේශීය සම්පත් ක්ෂය වීම් හරහා සම්පත් හිඟයක් ඇති විය හැක
- අලෙවිකරණ පිරිවැය ඉහළ යාම
- බුද්ධි ගලනය නිසා පුහුණු ශ්‍රම හිඟය

## ව්‍යාපාර යෙදවුම් නිමැවුම් ක්‍රියාවලියක් ලෙස විග්‍රහ කරයි

## ව්‍යාපාර ක්‍රියාවලිය

- යෙදවුම් හා නිමවුම් පිළිබඳ වූ නිෂ්පාදන ක්‍රියාවලිය ව්‍යාපාර ක්‍රියාවලිය නම් වේ

## සම්පත් / යෙදවුම්

භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා යොදා ගන්නා නිෂ්පාදන සාධක සම්පත් නම් වේ

01. භූමිය

- ස්වභාව ධර්මයේ දායාද ලෙස උරුම වූ සියලු සම්පත් භූමිය නම් වේ
- භූමිය සඳහා ලැබෙන ප්රතිලාභය බදු කුලී වශයෙන් නම් කෙරේ

02. ශ්‍රමය

- භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමේදී යොදා ගනු ලබන සේ සේවකයාගේ කායික හා මානසිකව වෙහෙසයි.
- මේ සඳහා ලැබෙන ප්‍රතිලාභය වැටුප් හා වේතන නම් වේ

03. ප්‍රාග්ධනය

- භාණ්ඩ හා සේවා නිෂ්පාදන ක්‍රියාවලියේදී ක්‍රියාවලියට යොදා ගන්නා මිනිසා විසින් නිෂ්පාදනය කරන ලද ආධාරකයන් ප්‍රාග්ධනය නම් වේ.
- ලැබෙන ප්‍රතිලාභය පොලිය නම් වේ

04. ව්‍යවසායකත්වය

- භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය වැනි නිෂ්පාදන සම්පත් සංවරණය කරමින් නිෂ්පාදනය සංවිධානය කරන මානව සම්පතයි.
- මේ සඳහා ලැබෙන ප්‍ර තිලාභය ලාභය වේ

05. තොරතුරු

- යම් අවසන් පරිශීලකයෙකුට තේරුම් ගත හැකි හා ප්‍රයෝජනයට ගත් හැකි වන ආකාරයට සකස් කරන ලද දත්ත තොරතුරු වේ

06. කාලය

- කාලය යනු මැනීමේදී භාවිතා කරන ප්‍රධාන උපාංගයයි. අනෙකුත් සම්පත් මෙහෙයවීමේදී කාලය වැදගත්ය. කාලය සීමිත හෙයින් යම් කාර්යයක් කිරීමේ දී ඒ සඳහා නිශ්චිත කාලයක් නියම කිරීමට සිදු කළ යුතුයි ය.

07. දැනුම

- අධ්‍යාපනය හෝ අත්දැකීම් තුළින් පුද්ගලයකු ලබාගත් අවබෝධය දැනුම්යි

## ව්‍යාපාර කාර්යයන්

ව්‍යාපාරයක් තම ඉලක්ක කරා ළඟා වීමේ ප්‍රයත්නයේදී කටයුතු රාශියක නියැළුණු දක්නට ලැබේ. ඒ අතර ප්‍රධාන කාර්යන් කිහිපයකි. මේවා ව්‍යාපාරයක ප්‍රධාන ශ්‍රිතයන් ලෙස ද හඳුන්වා දිය හැක.

01. පරිපාලනය

- ව්‍යාපාර කටයුතු හා සම්බන්ධ සියළු ලියකියවිලි පවත්වාගෙන යාම, සන්නිවේදන කටයුතු පවත්වාගෙන යාම යනාදී ව්‍යාපාරික පරිපාලන කාර්යන්ට ඇතුළත් වේ.

02. මෙහෙයුම් කටයුතු

- සම්පත්, භාණ්ඩ හෝ සේවා බවට පත් කිරීමේ ක්‍රියාවලිය වේ. මෙහිදී නිෂ්පාදන සැලසුම්කරණය, ද්‍රව්‍ය මිලදී ගැනීම්, තත්ත්ව පාලනය, තොග පාලනය යනාදි කාර්යයන් ප්‍රධාන වශයෙන් සිදුවේ.

03. අලෙවිකරණය

- ගණුදෙනුකරුවන්ගේ අවශ්‍යතාහා වුවමනා හඳුනාගෙන ඒවා තෘප්තිමත් කිරීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම අලෙවිකරණ යයි. නිෂ්පාදිතය, මිල කිරීම, බෙදා හැරීම හා ප්‍රවර්ධනය ප්‍රධාන වශයෙන් සිදුවේ.

04. මූල්‍ය  කටයුතු

- අරමුදල් සම්පාදනය හා යෙදවීම හා ඊට අදාළ කටයුතු මූල්‍ය  කටයුතු ලෙස හඳුන්වයි

05. මානව සම්පත් කටයුතු

- මිනිසුන් හෙවත් සේවකයින් ඵලදායිව මෙහෙයවීම් සම්බන්ධයෙන් කටයුතු වේ

06. පර්යේෂණ හා සංවර්ධන

- නිමැවුමේ ගුණ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම් හා නවීන නිපැයුම් ක්‍රම සොයා ගැනීම් යනාදී කටයුතු වේ

07. තොරතුරු කලමනාකරණ කටයුතු

- තොරතුරු පද්ධති පවත්වාගෙන යාම හා නව තොරතුරු සම්පාදනය හා යවත් කාලීන කිරීමේ කටයුතු වේ

## විවිධ නිර්ණායක මත ව්‍යාපාර වර්ග කිරීම

● ව්‍යාපාර වර්ග කල හැකි විවිධ නිර්ණායක ලැයිස්තුගත කරයි

● පාසල පිහිටි ප්‍රදේශයේ ඇති ව්‍යාපාර ලැයිස්තුගත කරයි

● එකම ව්‍යාපාරය විවිධ නිර්ණායක මත ලයිස්තු ගත වන බව පැහැදිලි කරයි.

● දෙන ලද ව්‍යාපාරය විවිධ නිර්ණායක මත කුමන වර්ගයට අයත් වන්නේ වන්නේදැයි දක්වයි

● ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය වර්ග කරයි

● දළ දේශීය නිෂ්පාදිතයට එක එක් නිෂ්පාදන අංශයේ දායකත්වය හඳුන්වයි.

1. ප්‍රදේශයේ පවතින ව්‍යාපාර කිහිපයක් නිදසුන් ලෙස ගෙන පහත ප්‍රශ්න වලට පිළිතුරු ගොඩනගන්න .

● එම ව්‍යාපාරය රාජ්‍ය අංශයට අයත් ද? පෞද්ගලික අංශයට අයත් ද?

● එම ව්‍යාපාරය සේවා සපයන ව්‍යාපාරයක් ද? ව්‍යාපාරයක්ද භාණ්ඩ නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් ද?

● එම ව්‍යාපාරය ලාභ අරමුණු කරගත් ව්‍යාපාරයක් ද? ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරයක් ද?

● එම ව්‍යාපාරය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක් ද ?මහා පරිමාණ ව්‍යාපාරයක් ද ?

## ව්‍යාපාර වර්ග කළ හැකි විවිධ නිර්ණායක ලැයිස්තුගත කිරීම

ව්‍යාපාර පහත සඳහන් නිර්ණායක මත වර්ග කළ හැකිය.

1. නිෂ්පාදනයේ ස්වභාවය අනුව
2. අයිතිය අනුව
3. පරමාර්ථය අනුව
4. පරිමාණය අනුව
5. නිෂ්පාදන අංශය අනුව

මීට අමතරව භාවිතා කරන නිර්ණායක,

6. සංවිධාන ක්‍රමය
7. නිෂ්පාදිතයේ ස්වභාවය
8. ආයතනික අංශ

නිෂ්පාදනයේ ස්වභාවය අනුව

- ප්‍රාථමික ව්‍යාපාර
- ද්විතියික ව්‍යාපාර
- තෘතීයික ව්‍යාපාර

නිෂ්පාදන අංශය අනුව

- කෘෂිකර්මාන්ත
- කර්මාන්ත
- සේවා

හිමිකාරීත්වය අනුව

- පෞද්ගලික අංශය
- රාජ්‍ය අංශය

අරමුණ අනුව

- ලාභය අරමුණු කරගත්
- ලාභය අරමුණු කර නොගත්

පරිමාණය අනුව

- සුළු හා මධ්‍ය පරිමාණ
- මහා පරිමාණ

සංවිධාන ක්‍රමය අනුව

- කේවල ස්වාමි ව්‍යාපාර
- හවුල් ව්‍යාපාර

- සමාගම්
- සමුපකාර
- සංස්ථා
- දෙපාර්තමේන්තු

නිෂ්පාදිත ස්වභාවය අනුව

- භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර
- සේවා නිෂ්පාදන ව්‍යාපාරය

ආයතනික අංශය අනුව

- මූල්‍ය නොවන අංශය
- මූල්‍ය අංශය
- රාජ්‍ය අංශය
- ගෘහ ඒකක හා ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශය

## ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය වර්ග කරන ආකාරය

වර්ෂයක් තුළ රටක සමස්ත භාණ්ඩ හා සේවාවන්ගේ මුලු වටිනාකම දළ දළ දේශීය නිෂ්පාදිතය යි. එනම් දෙන ලද කාල පරිච්ඡේදයක් තුලදී ආර්ථිකයක් විසින් නිෂ්පාදනය කරනු ලබන සියලුම අවසාන භාණ්ඩ හා සේවාවන්ගේ මුළු වෙළෙඳපොළ වටිනාකමයි.

ආර්ථිකයක වාර්ෂික කාර්ය සාධනය දළ දේශීය නිෂ්පාදනය මගින් පිළිඹිබු වේ. දළ දේශීය නිෂ්පාදිතය ප්‍රධාන අංශ තුනකට වර්ග කෙරේ .

1. කෘෂිකාර්මික අංශය
2. කාර්මික අංශය
3. සේවා අංශය

ශ්‍රී ලංකාවේ දළ දේශීය දළ දේශීය නිෂ්පාදිතය පිළිබඳ දත්ත ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සකස් කරන අතර එම දත්ත ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවේ සඳහන් වේ. එහිදී යොදා ගැනෙන්නේ කර්මාන්ත මූලය අනුව නිෂ්පාදන වර්ගීකරණය යි.

ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට එකෙක් අංශයේ දායකත්වය ඉදිරිපත් කිරීම

1. කෘෂිකර්මාන්තය

බෝග වගා, පශු , වන, ධීවර යනාදියෙන් බිහිවෙන්න නිෂ්පාදිතයි .

උදා-: බෝග වගා සහ ධීවර කර්මාන්තය

2. කර්මාන්ත

කැණීමෙන්, නිපැයුමෙන් ,තැනීමෙන් හෝ සැපයීමෙන් බිහිවන නිෂ්පාදිතයි.

උදා-: පතල් හා කැණීම් ,නිෂ්පාදන කර්මාන්ත, ඉදිකිරීම් කර්මාන්ත, විදුලිය , ගෑස් , වාෂ්ප හා වායුසමීකරණ සැපයුම්

3. සේවාවන්

පුද්ගලයින්ට හා ව්‍යාපාර වලට උවමනා භෞතිකව ස්පර්ශ කල නොහැකිය නිෂ්පාදිතයි.

උදා-: වෙළඳාම, ප්‍රවාහන සේවාවන්, නවාතැන් සැපයීම හා ආහාරපාන සැපයීම, මූල්‍ය රක්ෂණය, නිවාස අයිතිය හා දේපල වෙළඳාම, රාජ්‍ය පරිපාලනය

**2017 වර්ෂය ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය කර්මාන්ත මූලය අනුව දල දේශීය නිශ්පාදිතය ( 2010 ස්ථාවර මිල අනුව )**

**2017 වර්ෂයේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය**
**කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය**
**(2010 ස්ථාවර මිල අනුව)**

| ආර්ථික කටයුතු | ද.දේ.නි. ට දායකත්වය (%) |
|---|---|
| කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය | 6.9 |
| ධාන්‍ය වගාව (වී හැර) | 0.1 |
| වී වගාව | 0.5 |
| එළවළු වගාව | 0.5 |
| උක් වගාව, දුම්කොළ වගාව සහ වෙනත් බහුවාර්ෂික නොවන භෝග | 0.0 |
| පලතුරු වගාව | 0.5 |
| තෙල් සහිත පලතුරු භෝග වගාව (පොල්, තැඹිලි සහ ඔයිල් පාම් වගාව) | 0.6 |
| තේ වගාව | 0.7 |
| වෙනත් පානීය භෝග වගාවන් (කෝපි, කොකෝවා ආදී) | 0.0 |
| කුළුබඩු, සුවඳ දෙන භෝග, ඖෂධ සහ ඖෂධීය පැළෑටි වගාව | 0.7 |
| රබර් වගාව | 0.3 |
| වෙනත් බහුවාර්ෂික භෝග වගාව | 0.2 |
| කිරි, බිත්තර, මස් සහ වෙනත් සත්ත්ව නිෂ්පාදනයන් | 0.6 |
| පැළ බෝකිරීම සහ කෘෂිකාර්මික (අස්වනු නෙළීමෙන් පසු) කටයුතු සඳහා වන ආධාරක කාර්යයන් | 0.1 |
| වන වගාව, දැව කැපීම හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන | 0.7 |
| ධීවර කර්මාන්තය | 1.3 |
| කර්මාන්ත | 26.8 |
| පතල් හා කැණීම් කර්මාන්තය | 2.5 |
| නිෂ්පාදන කර්මාන්ත | 15.7 |
| විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයීම | 1.0 |
| ජලය පිරිසිදු කිරීම සහ බෙදාහැරීම | 0.1 |
| මලාපවහන කටයුතු, කසළ කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය | 0.3 |
| ඉදිකිරීම් කර්මාන්තය සහ එම සේවාවන් | 7.1 |
| සේවාවන් | 56.8 |
| වෙළඳාම, ප්‍රවාහන සේවාවන්, නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් | 22.9 |
| තොරතුරු සහ සන්නිවේදන කටයුතු පිළිබඳ සේවාවන් | 0.6 |
| මූල්‍ය, රක්ෂණ හා නිවාස අයිතිය සහ දේපළ වෙළඳාම | 13.4 |
| වෘත්තීයමය සේවාවන් සහ වෙනත් පෞද්ගලික සේවාවන් | 11.5 |
| රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ සේවාවන් | 8.3 |
| **මූලික මිල ගණන් අනුව සමස්ත එකතු කළ අගය** | 90.4 |
| භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු - සහනාධාර | 9.6 |
| **වෙළඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.)** | 100.0 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
**උපුටා ගැනීම** - ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2017 පිටු අංක 42

ජාතික නිෂ්පාදිතය වියදම සහ ආදායම කර්මාන්ත මූලය අනුව දළ ජාතික ආදායම ( පවත්නා වෙළෙඳපොළ මිල අනුව)

### ජාතික නිෂ්පාදිතය, වියදම සහ ආදායම
### කර්මාන්ත මූලය අනුව දළ ජාතික ආදායම (පවත්නා වෙළඳපොළ මිල අනුව)

රුපියල් මිලියන

| ආර්ථික කටයුතු | 2017 (ඇ) |
|---|---|
| කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය | 1,024,117 |
| 1. ධාන්‍ය වගාව (වී හැර) | 14,640 |
| 2. වී වගාව | 110,418 |
| 3. එළවළු වගාව | 66,363 |
| 4. උක් වගාව, දුම්කොළ වගාව සහ වෙනත් බහුවාර්ෂික නොවන භෝග | 3,200 |
| 5. පළතුරු වගාව | 84,327 |
| 6. තෙල් සහිත පළතුරු භෝග වගාව (පොල්, තැඹිලි සහ පාම් ඔයිල් ගස් වගාව) | 104,575 |
| 7. තේ වගාව | 116,694 |
| 8. වෙනත් පාන ජාතීය භෝග වගාව (කෝපි, කොකෝවා ආදී) | 2,044 |
| 9. කුළුබඩු, සුවඳ දෙන භෝග, ඖෂධ සහ ඖෂධීය භෝග වගාව | 87,676 |
| 10. රබර් වගාව | 17,788 |
| 11. වෙනත් බහුවාර්ෂික භෝග වගාව | 24,227 |
| 12. කිරි, බිත්තර, මස් සහ වෙනත් සත්ත්ව නිෂ්පාදනයන් | 99,486 |
| 13. පැල රෝපණය සහ කෘෂිකාර්මික කටයුතු සඳහා වන ආධාරක සේවාවන් | 14,852 |
| 14. වන වගාව, දැව හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන | 100,094 |
| 15. සාගර ධීවර කර්මාන්තය සහ සාගර ජලජීවී වගාව | 159,130 |
| 16. මිරිදිය ධීවර කර්මාන්තය සහ මිරිදිය ජලජීවී වගාව | 18,603 |
| කර්මාන්ත | 3,614,916 |
| 17. පතල් හා කැණීම් කර්මාන්තය | 341,219 |
| 18. ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදන | 976,820 |
| 19. රෙදිපිළි, නිමි ඇඳුම්, සම් සහ සම් ආශ්‍රිත නිෂ්පාදන | 477,409 |
| 20. ගෘහභාණ්ඩ හැර දැව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 24,793 |
| 21. කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, මුද්‍රණ කටයුතු සහ දත්ත හා පටිගත කළ මාධ්‍ය නිෂ්පාදනය | 44,682 |
| 22. අඟුරු සහ ශෝධිත තෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන | 4,688 |
| 23. රසායන ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන, ඖෂධ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 87,769 |
| 24. රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 107,076 |
| 25. ලෝහමය නොවන වෙනත් ඛනිජ නිෂ්පාදන | 102,960 |
| 26. ලෝහ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන | 68,943 |
| 27. යන්ත්‍රෝපකරණ නිෂ්පාදන | 62,953 |
| 28. ගෘහ භාණ්ඩ නිෂ්පාදනය | 87,215 |
| 29. වෙනත් නිෂ්පාදන කර්මාන්ත, යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව හා සවිකිරීම | 74,461 |
| 30. විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයීම | 88,102 |
| 31. ජලය එක්රැස් කිරීම, පිරිපහදු කිරීම සහ බෙදාහැරීම | 17,733 |
| 32. මලාපවහන කටයුතු, කසළ කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය | 20,231 |
| 33. ඉදිකිරීම් කර්මාන්තය සහ එම සේවාවන් | 1,027,860 |
| සේවාවන් | 7,412,033 |
| 34. තොග හා සිල්ලර වෙළඳාම | 1,404,435 |
| 35. මගීන් හා භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම | 1,476,433 |
| 36. තැපැල් සහ කුරියර් සේවාවන් | 5,036 |
| 37. නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් | 207,053 |
| 38. ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු | 4,883 |
| 39. විදුලි සංදේශ සේවාවන් | 76,702 |
| 40. පරිගණක වැඩසටහන් හා මෘදුකාංග නිෂ්පාදනය සහ තොරතුරු තාක්ෂණ සේවාවන් | 19,180 |
| 41. මූල්‍ය හා මූල්‍ය අතරමැදි සේවාවන් සහ ඒ ආශ්‍රිත වෙනත් සේවාවන් | 499,149 |
| 42. රක්ෂණය, ප්‍රතිරක්ෂණය සහ විශ්‍රාම අරමුදල් කළමනාකරණය | 143,843 |
| 43. නිවාස අයිතිය සහ දේපළ වෙළඳාම | 770,243 |
| 44. වෘත්තීයමය සේවාවන් | 224,429 |
| 45. රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව සහ සමාජ ආරක්ෂණය | 746,439 |
| 46. අධ්‍යාපනය | 266,317 |
| 47. සෞඛ්‍ය, නේවාසික රැකවරණ සේවාවන් සහ සමාජ සේවාවන් | 276,132 |
| 48. වෙනත් පෞද්ගලික සේවාවන් | 1,291,758 |
| මූලික මිල අනුව සමස්ත එකතු කළ අගය | 12,051,065 |
| භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු - සහනාධාර | 1,238,401 |
| වෙළඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය (දදේනි) | 13,289,466 |
| විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම | -356,282 (ඇ) |
| වෙළඳපොළ මිල අනුව දළ ජාතික ආදායම | 12,933,185 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## පවත්නා වෙළෙඳපොළ මිල යටතේ ආයතනික අංශ අනුව සමස්ත එකතු කළ අගය


**පවත්නා වෙළෙඳ පොළ මිල යටතේ ආයතනික අංශ අනුව සමස්ත එකතු කළ අගය**

ප්‍රතිශතක දායකත්වය (%)

| අයිතමය | 2017 | | | |
|---|---|---|---|---|
| | මූල්‍ය නොවන අංශය | මූල්‍ය අංශය | රාජ්‍ය අංශය | ගෘහ ඒකක හා ලා. නො. ගෘ. සේ. ආ. අංශය |
| කෘෂිකර්මාන්තය | 19.9 | - | - | 80.1 |
| කර්මාන්ත | 61.7 | - | 1.5 | 36.7 |
| සේවාවන් | 23.8 | 8.4 | 14.9 | 52.9 |
| මූලික මිල ගණන් අනුව සමස්ත එකතු කළ අගය | 34.9 | 5.2 | 9.6 | 50.3 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු

**නිෂ්පාදනය කෘෂිකාර්මික ,කාර්මික, සේවා ලෙස බෙදී යන ආකාරය ගැලීම් සටහනක් මගින් දැක්වීම**



## නිෂ්පාදනය ස්වභාවය අනුව ව්‍යාපාර වර්ග කරයි

1. ප්‍රාථමික ව්‍යාපාර

- ස්වභාව ධර්මයෙන් ලැබී ඇති දේ ඒ ආකාරයෙන්ම ප්‍රයෝජනයට ගන්නා නිෂ්පාදන ව්‍යාපාර වෙයි.

උදා-: කෘෂිකාර්මික බෝග වගාව, වන වගාව, ධීවර කර්මාන්තය, පතල් හා කැණීම් කර්මාන්තය

2. ද්විතීයික ව්‍යාපාර

- ප්‍රාථමික නිෂ්පාදන නැවත වෙනස් කිරීමට භාවිතා කිරීමේ ව්‍යාපාර ද්විතීක ව්‍යාපාර වේ.

උදා-: නිෂ්පාදන කර්මාන්ත , ඉදිකිරීම් කර්මාන්ත

3. තෘතීයික ව්‍යාපාර

- සියලුම සේවා සැපයීමේ ව්‍යාපාර වේ

උදා-: විදුලිය , ගෑස් , වාෂ්ප හා වායුසමීකරණ සැපයීම , ජලය පිරිසිදු කිරීම සහ බෙදා බෙදාහැරීම, මල ප්‍රවාහන කටයුතු, කසළ කළමනාකරණය, වෙළදාම, ප්‍රවාහන සේවාවන්, නවාතැන් සැපයීම හා ආහාරපාන සැපයීම.

## කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිශ්පාදිතය වර්ගීකරණය.

### කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය වර්ගීකරණය

| ආර්ථික කටයුතු | ද.දේ.නි. ට දායකත්වය (%) | |
|---|---|---|
| **කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය** | **6.9** | **කෘෂිකර්මාන්තය 6.9%** |
| 1. ධාන්‍ය වගාව (වී හැර) | 0.1 | |
| 2. වී වගාව | 0.5 | |
| 3. එළවළු වගාව | 0.5 | |
| 4. උක් වගාව, දුම්කොළ වගාව සහ වෙනත් අනුවර්ගීකරණය නොවන භෝග | 0.0 | |
| 5. පලතුරු වගාව | 0.5 | |
| 6. තෙල් සහිත පලතුරු භෝග වගාව (පොල්, තැඹිලි සහ ඔයිල් පාම් වගාව) | 0.6 | |
| 7. තේ වගාව | 0.7 | |
| 8. වෙනත් පානීය භෝග වගාවන් (කෝපි, කොකෝවා ආදී) | 0.0 | |
| 9. කුළුබඩු, සුවඳ දෙන භෝග, ඖෂධීය සහ ඖෂධීය පැළෑටි වගාව | 0.7 | |
| 10. රබර් වගාව | 0.3 | |
| 11. වෙනත් අනුවර්ගීකරණය නොවූ භෝග වගාව | 0.2 | |
| 12. කිරි, බිත්තර, මස් සහ වෙනත් සත්ත්ව නිෂ්පාදනයන් | 0.6 | |
| 13. පැළ බෝකිරීම සහ කෘෂිකාර්මික (ඉහතින් සඳහන් කටයුතු සඳහා වන ආධාරක කාර්යයන් | 0.1 | |
| 14. වන වගාව, ගස් කැපීම හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන | 0.7 | |
| 15. ධීවර කර්මාන්තය | 1.3 | |
| **කර්මාන්ත** | **26.8** | **කර්මාන්ත 26.8%** |
| 16. පතල් හා කැණීම් කර්මාන්තය | 2.5 | |
| 17. නිෂ්පාදන කර්මාන්ත | 15.7 | |
| 18. විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයීම | 1.0 | |
| 19. ජලය පිරිසිදු කිරීම සහ බෙදාහැරීම | 0.1 | |
| 20. මලාපවහන කටයුතු, කසළ කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය | 0.3 | |
| 21. ඉදිකිරීම් කර්මාන්තය සහ එම සේවාවන් | 7.1 | |
| **සේවාවන්** | **56.8** | **සේවාවන් 56.8%** |
| 22. වෙළෙඳාම, ප්‍රවාහන සේවාවන්, නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් | 22.9 | |
| 23. තොරතුරු සහ සන්නිවේදන කටයුතු පිළිබඳ සේවාවන් | 0.6 | |
| 24. මූල්‍ය, රක්ෂණය හා නිවාස අයිතිය සහ දේපළ වෙළෙඳාම | 13.4 | |
| 25. වෘත්තීයමය සේවාවන් සහ වෙනත් පෞද්ගලික සේවාවන් | 11.5 | |
| 26. රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ සේවාවන් | 8.3 | |

| ආර්ථික කටයුතු | ද.දේ.නි. ට දායකත්වය (%) | |
|---|---|---|
| **කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය** | | **ප්‍රාථමික 9.3%** |
| 1. ධාන්‍ය වගාව (වී හැර) | 0.1 | |
| 2. වී වගාව | 0.5 | |
| 3. එළවළු වගාව | 0.5 | |
| 4. උක් වගාව, දුම්කොළ වගාව සහ වෙනත් අනුවර්ගීකරණය නොවන භෝග | 0.0 | |
| 5. පලතුරු වගාව | 0.5 | |
| 6. තෙල් සහිත පලතුරු භෝග වගාව (පොල්, තැඹිලි සහ ඔයිල් පාම් වගාව) | 0.6 | |
| 7. තේ වගාව | 0.7 | |
| 8. වෙනත් පානීය භෝග වගාවන් (කෝපි, කොකෝවා ආදී) | 0.0 | |
| 9. කුළුබඩු, සුවඳ දෙන භෝග, ඖෂධීය සහ ඖෂධීය පැළෑටි වගාව | 0.7 | |
| 10. රබර් වගාව | 0.3 | |
| 11. වෙනත් අනුවර්ගීකරණය නොවූ භෝග වගාව | 0.2 | |
| 12. කිරි, බිත්තර, මස් සහ වෙනත් සත්ත්ව නිෂ්පාදනයන් | 0.6 | |
| 13. පැළ බෝකිරීම සහ කෘෂිකාර්මික (ඉහතින් සඳහන් කටයුතු සඳහා වන ආධාරක කාර්යයන් | 0.1 | |
| 14. වන වගාව, ගස් කැපීම හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන | 0.7 | |
| 15. ධීවර කර්මාන්තය | 1.3 | |
| 16. පතල් හා කැණීම් කර්මාන්තය | 2.5 | |
| **කර්මාන්ත** | | **ද්විතීයික 22.8%** |
| 17. නිෂ්පාදන කර්මාන්ත | 15.7 | |
| 21. ඉදිකිරීම් කර්මාන්තය සහ එම සේවාවන් | 7.1 | |
| **සේවාවන්** | | **තෘතීයික 58.1%** |
| 18. විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයීම | 1.0 | |
| 19. ජලය පිරිසිදු කිරීම සහ බෙදාහැරීම | 0.1 | |
| 20. මලාපවහන කටයුතු, කසළ කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය | 0.3 | |
| 22. වෙළෙඳාම, ප්‍රවාහන සේවාවන්, නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් | 22.9 | |
| 23. තොරතුරු සහ සන්නිවේදන කටයුතු පිළිබඳ සේවාවන් | 0.6 | |
| 24. මූල්‍ය, රක්ෂණය හා නිවාස අයිතිය සහ දේපළ වෙළෙඳාම | 13.4 | |
| 25. වෘත්තීයමය සේවාවන් සහ වෙනත් පෞද්ගලික සේවාවන් | 11.5 | |
| 26. රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ සේවාවන් | 8.3 | |

● නිෂ්පාදනයේ ස්වාභාවය අනුව වර්ග කිරීමේදී පතල් හා කැණීම් කර්මාන්තය ප්‍රාථමික අංශයට අයත් වන අතර කර්මාන්ත මූලය අනුව වර්ග කිරීමේදී පතල් හා කැණීම් කර්මාන්තය අංශයට අයත් කෙරේ.

● එසේම නිෂ්පාදනයේ ස්වාභාවය අනුව විදුලිය, ගෑස්, වාෂ්ප හා වායුසමීකරණ සැපයීම, ජලය පිරිසිදු කිරීම හා බෙදාහැරීම ,මල ජ්රවාහන කටයුතු , කසළ කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය තෘතීයිය අංශයට අයත් වුවද කර්මාන්ත මූලය අනුව ඒවා කර්මාන්ත අංශයට අයත් වේ.

ආංශික සංයුතිය තුළ සේවා අංශයේ දායකත්වය ඉහළ යාමට හේතු

● පාරිභෝගිකයන්ගේ වැයකල හැකි ආදායම ඉහළ යාම

● ජීවන රටාව වෙනස් වීම

● තාක්ෂණයේ සංවර්ධන

● වෘත්තීය සේවා සඳහා ඇති ඉල්ලුම වැඩිවීම

● ඉලෙක්ට්‍රොනික් වාණිජ ව්‍යාප්තිය

● සේවා නිෂ්පාදිතයට හොඳ මිලක් ලැබීම

● රජයේ ප්‍රතිපත්ති වෙනස් වීමෙන් හිතකර බලපෑම් ඇතිවීම

● උගත් තරුණ පරම්පරාවේ වෙනස් වූ අපේක්ෂා

● ගෝලීයකරණය /විවෘත ආර්ථිකය

● නාගරීකරණය/ නාගරික පහසුකම් වැඩි වීම

● සේවා ව්‍යාපාර වලට ඇතුලත් වීමට ඇති බාධා අඩුවීම

● ජනගහනය වර්ධනය

● වින්දනය හා රසාස්වාදන කටයුතු වල කටයුතුවල ව්‍යාප්තිය

● සංචාරක කටයුතු පුළුල් වීම

● පුද්ගල කාර්යබහුලත්වය

## උනන්දුවක් දක්වන පාර්ශව ව්‍යාපාර කෙරෙහි උනන්දුව දැක්වීමට හේතු

- තෝරාගත් ව්‍යාපාරයක් ඇසුරෙන් ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව ලැයිස්තු ගත කරයි.
- එකෙක් පාර්ශවය ව්‍යාපාර කෙරෙහි උනන්දු වීමට හේතු පැහැදිලි කරයි.
- එකෙක් පාර්ශවය ව්‍යාපාර කෙරෙහි උනන්දු වීමට හේතු විවිධ වන බව අනාවරණය කරයි.
- ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව ව්‍යාපාරයකට වැදගත් වන ආකාරය පෙන්වා දෙයි.
- ව්‍යාපාරයක සාර්ථක පැවැත්ම සඳහා උනන්දුවක් දක්වන පාර්ශවයන්ගේ අපේක්ෂා පිළිබඳව සැලකිලිමත් විය යුතු බව පෙන්වා දෙයි.
- ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව ව්‍යාපාර කෙරෙහි දක්වන ඇල්ම සහ ඔවුන්ගේ ව්‍යාපාරය කෙරෙහි බලපෑම් කිරීමට ඇති හැකියාව මත එම පාර්ශවයන්ගේ ප්‍රමුඛතාව තීරණය කර කරයි.

පහත සඳහන් පාර්ශව ආයතන පිළිබඳ උනන්දුව දක්වන පාර්ශවය විමසා රූප සටහන සම්පූර්ණ කරන්න .

ශිෂ්‍යයා -

- දෙමව්පියන්
- 
- 
- 
- 
- 

පාසල -

- ශිෂ්‍යයින්
- 
- 
- 
- 
- 

## උනන්දුවක් දක්වන පාර්ශ්ව යනු ,

- අරමුණු ඉටුකර ගැනීම සඳහා කටයුතු කිරීමේදී ඒ සඳහා සෘජුවම හෝ වක්‍රාකාරයෙන් බලපෑම් කරන පුද්ගලයින් හෝ කණ්ඩායම් වේ .
- මොවුන් ව්‍යාපාරයෙන් යමක් අපේක්ෂා කරන අතර ඒ නිසා ඒ කෙරෙහි අවධානයෙන් සිටි. ඔවුන් මත ආයතනයේ යැපීමත් , ආයතනය ඔවුන් මත යැපීමත් සිදුවේ.
- ව්‍යාපාරයක සාර්ථක පැවැත්ම සඳහා උනන්දුව දක්වන පාර්ශවයන් ගේ අපේක්ෂාව පිළිබඳ සැලකිලිමත් විය යුතුයි .

තෝරාගත් ව්‍යාපාරයක් ඇසුරෙන් ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව ලැයිස්තුගත කිරීම.

ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව කිහිපයක් පහත දැක්වේ.

1. අයිතිකරුවන් / කොටස් හිමියන්

2. කළමනාකරුවන්

3.සේවකයින්

4. ණය හිමියන්

5. පාරිභෝගිකයන්

6. සැපයුම්කරුවන්

7. විභව ආයෝජකයන්

8. රජය

9. ප්‍රජාව

එක් එක් පාර්ශවය ව්‍යාපාර කෙරෙහි උනන්දු වීමට හේතු පැහැදිලි කිරීම..

උනන්දුවක් දක්වන පාර්ශව සහ උනන්දු වීමට හේතු

1. අයිතිකරුවෝ කොටස් හිමියෝ

- තමන් ආයෝජනය කරන මුදලට ප්‍රමාණවත් ලාභයක් ලැබේ දැයි දැනගැනීම.
- ව්‍යාපාරයේ වර්ධනය පිළිබඳව දැනගැනීම.
- වෙළඳපල කොටස දැනගැනීම .

2. කළමනාකරුවෝ

- ව්‍යාපාරයේ ලාභය උපරිම කිරීම.
- ව්‍යාපාරය වර්ධනය පිළිබඳ දැනගැනීමට
- කළමනාකරණ තීරණ වල සාර්ථක අසාර්ථක බව දැනගැනීමට

3. සේවකයෝ

- ඉහල වැටුපක් ලබා ගැනීමට
- ප්‍රසාද දීමනා ලැබේදැයි දැනගැනීම
- රැකියාවේ උසස්වීම් ලබාගැනීමට

4. පාරිභෝගිකයෝ / ගනුදෙනුකරුවෝ

- ගුණාත්මක භාණ්ඩ හා සේවා ලබා ගැනීම
- වගකීම් නිසි පරිදි ඉටු කරන්නේ දැයි බැලීම
- ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු කර ගැනීමට

5. ණය හිමියෝ

- සපයන ලද ණය මුදල් ආපසු ලබා ගැනීමේ හැකියාව දැනගැනීම
- ණය මුදලේ සුරක්ෂිත බව දැන ගැනීම
- ඇප සුරැකුම් පත්‍ර සුරක්ෂිත බව තහවුරු කරගැනීම

6. සැපයුම්කරුවෝ

- අඛණ්ඩව ඇණවුම් ලබා ගැනීමට
- සපයන ලද භාණ්ඩ සඳහා මුදල් ආපසු අයකරගැනීමට

7. විභව ආයෝජකයෝ

- තමන් සතු සම්පත් අනාගතයේදී එම ව්‍යාපාරයේ ආයෝජනය කිරීමට

8. රජය

- බදු අයකර ගැනීමට / බදු සහන ලබා දීමට

- සේවා නියුක්තිය වර්ධනය කරගැනීමට
- ආර්ථික සංවර්ධනය පිළිබඳ මැන බැලීමට

9. ප්‍රජාව

- පරිසරය සුරැකීම පිළිබඳව සොයා බැලීමට
- රැකියා අවස්ථා ලබා ගැනීමට

10. තරගකරුවෝ

- අලෙවි උපාය මාර්ග හඳුනා ගැනීමට
- මිල පිළිබඳව දැන ගැනීමට
- වෙළෙඳපොළ කොටස හඳුනා ගැනීමට

## ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව ව්‍යාපාරයකට වැදගත් වන ආකාරය

ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව ව්‍යාපාරයකට වැදගත් වීමට හේතු කිහිපයක් පහත සඳහන් වේ.

1. අයිතිකරුවෝ

- ආයෝජන වැඩි කර ගැනීමට
- ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු කර ගැනීම

2. සේවකයෝ

- සේවක කාර්යක්ෂමතාව වැඩි කිරීමට
- රඳවා ගැනීමට
- සේවක ආකර්ශනය ලබා ගැනීමට

3. ගනුදෙනුකරුවෝ

- අදාල භාණ්ඩ හෝ සේවා සඳහා වෙළඳපොළ සුරක්ෂිත කර ගැනීමට
- පාරිභෝගික විශ්වාසය දිනා ගැනීමට
- ගණුදෙනුකරුවන්ගේ පක්ෂපාතීත්වය ඇති කරගැනීමට

4. ණය හිමියෝ

- අඛණ්ඩව අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගැනීමට
- අඩු පිරිවැයකින් අරමුදල් සම්පාදනය කර ගැනීමට

5. රජය

- බදු සහන ලබා ගැනීමට
- යටිතල පහසුකම් ලබා ගැනීම
- තාක්ෂණික දැනුම ලබා ගැනීමට

## එක් එක් පාර්ශවයක් ව්‍යාපාර කෙරෙහි උනන්දු වීමට හේතු විවිධ වන්නේ ඇයි ?

1. එක් එක් පාර්ශව ව්‍යාපාරයට සපයන දෑ විවිධාකාර වීම.

- උදා -: සේවකයින් ශ්‍රමය සැපයීම , ණයහිමියන් ණය මුදල් සැපයීම යනාදී ලෙස

2. ඇතැම් පාර්ශව අභ්‍යන්තර වීම හා ඇතැමුන් බාහිර පරිසරය නියෝජනය කිරීම.

- උදා -: සේවකයින් අභ්‍යන්තර වන අතර ගනුදෙනුකරුවන් බාහිර වේ.

3. ඇතැම් පාර්ශව ව්‍යාපාරයට ඉතා සමීප වන අතර ඇතැම් පාර්ශව ඉතා දුරස්ථව සිටීම්.

- උදා -: අයිතිකරුවන් සමීප වන අතර මාධ්‍ය ආයතන දුරස්ථව සිටීම.

4. ඇතැම් පාර්ශව ව්‍යාපාරයකට ධනාත්මක බලපෑම් එල්ල කරන අතර ඇතැම් පාර්ශව සෘණාත්මක බලපෑම් එල්ල කිරීම.

- උදා -: අයිතිකරුවන් ධනාත්මක බලපෑම් සිදු කරන අතර තරගකරුවන් සෘණාත්මක බලපෑම් එල්ල කරයි.

ව්‍යාපාරයක සාර්ථක පැවැත්ම සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගේ අපේක්ෂා පිළිබඳව සැළකිලිමත් වීමේ වැදගත්කම ( ඇල්මැති පාර්ශව වල අපේක්ෂාවන් පිලිබඳ සැළකිලිමත් වීමේ වැදගත්කම )

1. ගනුදෙනුකරු තෘප්තිය වර්ධනය වීමෙන් ඉල්ලුම ඉහළ යාම

2. සේවකයින් අභිප්‍රේරණය වීම හා ශ්‍රම ඵලදායිතාවය ඉහළ යාම

3. සැපයුම්කරුවන් ඉහළ සේවා පහසුකම් සැපයීම

4. කළමනාකරුවන්ගේ කාර්යක්ෂමතාව හා සඵලදායිත්වය ඉහලයාම

5.ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු වීම හා වර්ධනය

6. කීර්තිනාමය ඉහළ යාම

7. මූල්‍ය සම්පාදනය පහසු වීම

8. රජයේ විවිධ දිරිගැන්වීම් පහසුකම් ලබා ගත හැකි වීම

9. ප්‍රජාව ධනාත්මක බලපෑම් ඇති කිරීම මගින්

ව්‍යාපාරයක සාර්ථක පැවැත්ම තීරණය වේ

- ව්‍යාපාරයක උනන්දුව දක්වන පාර්ශවයන්ගේ ප්‍රමුඛතාව හඳුනාගැනීම.
- ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව ව්‍යාපාරයකට එහි දක්වන ඇල්ම සහ ඔවුන්ට ව්‍යාපාරය කෙරෙහි බලපෑම් කිරීමට ඇති හැකියාව මත එම පාර්ශවයන්ගේ ප්‍රමුඛතාව තීරණය වේ.
- ඒ අනුව පාරිභෝගිකයන් ව්‍යාපාරයක ප්‍රමුඛතම පාර්ශවය වන අතර අනතුරුව අයිතිකරුවන් කළමනාකරුවන් සේවකයින් ප්‍රජාව සහ රජය යන පාර්ශව මූලිකත්වය ගනී.

A/L NOTE BOOK
All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

[www.ALNoteBook.com](http://www.ALNoteBook.com)

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

“The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements.”